# තර්කණය පිළිබඳ බෞද්ධ විචාරය

සමන්ත ඉලංගකෝන්

## 1. සාරාංශකරණය

ලෝකය පිළිබඳව යථාර්ථවාදී වූ ඥානයක් සැබෑ දැක්මක් සහිතව අත්පත් කරගැනීම (යථාභූත ඤාණදස්සන) බෞද්ධ පරමාර්ථය ලෙස පිළිගන්නේ නම් ඊළඟට පැණෙන ගැටලුව වන්නේ එම අවබෝධාත්මක ඥානය අත්පත් කරගන්නා වූ ක්‍රමවේදය කුමක්ද යන්නයි. මෙහිදී ලෝකය යන ඡත්‍ර පදයෙන් සමස්ත විශ්වයේම අන්තර්ගත සියලු ජීවී අජීවී සියල්ල අදහස් නොකෙරේ. ලෝකය, සමස්තය නැතහොත් සියල්ල යන්නෙන් අදහස් කෙරෙන්නේ අභිධර්ම යුගයේ භාවිත 'ධම්ම' යන්නෙන් අදහස් කළ දේවල් ය. සියල්ල නැතහොත් සමස්තය පිළිබඳ ලබන දැනුම නම් මේ මොහොත පිළිබඳව ලබන තත්ත්වානුකූල දැනුම වන අතර එය ක්ෂණයක් දක්වා ඌනනය කිරීමේ අරමුණ වන්නේ යථාර්ථය අවතක්සේරු කිරීම නොවේ. මොහොත දැනගත නොහැකි නම් සියල්ල දැනගන්නේ කෙසේද යන ගැටලුව මතුවන නිසාය.

මෙම ලිපියෙහි අරමුණ වන්නේ භාරතීය දාර්ශනික හා ආගමික පරිසරය තුළ මෙකී යථාර්ථ ඥානය අත්පත් කරගැනීමෙහි ලා භාවිත ඉතා ප්‍රචලිත ඥාන මාර්ගයක් වූ තර්කය පිළිබඳව බෞද්ධ දෘෂ්ටි කෝණය විමසා බැලීමයි.

## 2. ඥාන මාර්ග අතර තර්කයට හිමි වූ ස්ථානය

පුද්ගලයා විසින් දැනුම අත්පත් කරගන්නේ කෙසේද? යන්න දාර්ශනික විෂය ක්ෂේත්‍රය තුළ විමසනු ලබන ගැටලු අතර කේන්ද්‍රීය ගැටලුව කි. ඈත භාරතීය දර්ශනය තුළ ප්‍රභවය වූ දාර්ශනික ගුරුකුල අතර මෙහි ලා ප්‍රවේශයන් තුනකින් ප්‍රධාන වශයෙන් පිළිතුරු ලබාදුන් බව මහාචාර්ය කේ.එන්. ජයතිලක ප්‍රකාශ කරයි.[1]

01. සාම්ප්‍රදායිකවාදීන්

02. බුද්ධිවාදීන්

03. අනුභූතිවාදීන්

මෙම චින්තකයන් අතර සම්ප්‍රදායයෙන් එන කරුණු පිළිගත් දාර්ශනිකයන් පළමු කාණ්ඩයට අයත් වන අතර ආප්තය, අධිකාරිය, ආගමික පතපොත හෝ ඇසූ දේ සත්‍යය සේ පිළිගැනීම ඔවුනගේ ලක්ෂණය යි. තෙවැනි කාණ්ඩයට අයත් වූයේ හුදු ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයම පිළිගත් අත්දැකීම් ක්ෂේත්‍රයම පමණක් සැබෑ ඥානය ලබාදෙන බව තහවුරු කළ චින්තකයන් ය. මෙම ගුරුකුල අතරින් බුද්ධිවාදීන්යැයි සඳහන් ගුරුකුලයට තාර්කිකයන් අයත් වේ. ගතානුගතිකත්වය ප්‍රතික්ෂේප කළ මොවුන් අනුභූතිය ඔස්සේ ලබන ඥානය පවා තාර්කිකව හා විචාර බුද්ධියෙන් යුතුව කල්පනා කිරීමෙන් දැනුම අත්පත් කරගත හැකි බව පෙන්වා දුන්හ.[2]

නිවැරදි ඥානය අත්පත් කර ගැනීමෙහි ලා තර්කය ප්‍රධාන ඥාන මාර්ගයක් සේ පිළිගත් ආගමික හා දාර්ශනික ගුරුකුල පැවති බව මූලාශ්‍රයන්ගෙන් හෙළි වේ. උදාහරණ වශයෙන් කාලාම සූත්‍රයෙහි හමුවන ඥාණමය මූලාශ්‍රයන්ගෙන් හතරක්ම තර්කය ආශ්‍රය කරගෙන ක්‍රියාත්මක වේ. එනම්, තක්ක හේතු, නය හේතු, ආකාර පරිවිතක්ක හා දිට්ඨි නිජ්ඣානක්ඛන්ති යන ඥාන මාර්ගයන් ය.[3] විසංවාද මතු නොවන සේ තර්ක කිරීමට, තමා අදහන න්‍යායයන් අනුව කරුණු පැහැදිලි කිරීමට, කිසියම් පද්ධතියක පවත්නා ලක්ෂණ විමර්ශනය කිරීමට මෙන්ම දෘෂ්ටිවාද හා මතවාද අනුව කරුණු ඉදිරිපත් කිරීමට තාර්කිකත්වය මූලික වේ.[4]

## 3. තර්කණය ; ඓතිහාසික පසුබිම

පැරණි භාරතීය ආගමික හා දාර්ශනික පරිසරයෙහි තර්කය අවිය කරගෙන මතවාද ඉදිරිපත් කළ හා තහවුරු කළ ආගමික ශාස්තෘවරුන් මෙන්ම දාර්ශනික ගුරුකුල ද පැවති බව මූලාශ්‍රයන්ගෙන් හෙළිවන කරුණ කි. උදාහරණ වශයෙන් බෞද්ධ මූලාශ්‍රයන්ගේ සඳහන් වන 'තක්කී වීමංසී' හා 'තක්කිකා' යන භාවිතයන්ගෙන් ගම්‍ය වන තාර්කිකයන් ගෙනහැර දැක්විය හැකිය.[5] බුදුන් වහන්සේට සමකාලීනව පවා තර්කය අවිය කරගත්, තර්කයෙන් සැබෑ ඥානය අත්පත් කරගත හැකි බව පිළිගත් තාර්කිකයන් භාරතයේ විසූ බව මෙයින් පැහැදිලි වේ. ඔවුන්ගේ මුවගෙහි නිතරම රැව් පිළිරැව් දුන්, පාණ්ඩිත්වය විශද කළා වූ ප්‍රකාශනයක් වූයේ "ඉදමේව සච්චං මෝඝමඤ්ඤං" යන්න යි.[6] මෙම පණ්ඩිතමානී ප්‍රකාශනය තුළ ගම්‍යමාන අර්ථය නම් තර්කයට කෙතරම් ප්‍රධාන තැනක් මෙම වාදාරෝපණය කරන්නන් පිරිනමා තිබුණේද යන්න යි. ඔවුන්ගේ ඍජු හා දෘඪතර අදහස වූයේ තර්කය සමස්ත ඥානය සම්පාදනය කරදෙන බව යි. තර්කය හරහා ඔවුන් ලබාගත් ඥානයන් සත්‍ය සේ පිළිගෙන මෙයම සත්‍යය වේ. අනික්වා අසත්‍ය වේ. යන ස්ථිර අදහස ප්‍රකාශ කිරීමට පවා ඔව්හු නො පැකිළ වූහ. මෙ නයින් පැහැදිලි වන්නේ භාරතීය දාර්ශනික විෂය ක්ෂේත්‍රය තුළ තර්කයට හිමිව තිබූ සුවිශේෂී ස්ථානය යි. සමහරෙක් සියතෙහි උණ දණ්ඩක් හෝ වෙනත් දණ්ඩක් රඳවාගෙන ඔබමොබ සැරිසැරුවේ තමා සමඟ වාදයට, තර්කයට පැමිණෙන ලෙස අන්‍යයන්ට අභියෝග කරන රිසියෙනි. ජනීජනයා රැස්ව ඇති ස්ථානයක තවත් තාර්කිකයෙකු හා වාදකොට ජයග්‍රහණය කිරීමෙහි අභිලාෂයෙන් පොළඹවනු ලදුව ඇතැමෙක් සිය මතයෙහි, දෘෂ්ටියෙහි නිමග්නව සිටියාහ. සිය මතය සමර්ථනය කරනු වස් පර මතය ඛණ්ඩනය කරනු වස් විවිධ තර්ක ඉදිරිපත් කළ ඔව්හු අවසානයෙහි මුවසැතින් පහර දී අතින්පයින් ද ගැටුම් ඇතිකර ගත්හ. මෙසේ අවසානයේ තර්කණය සමාජ ප්‍රශ්නයක් දක්වා දුරදිග ගියේ ය.[7] එහි ප්‍රතිඵලයක් ලෙස එකල සිටි ඇතැම් රජවරු තාර්කිකයන්ට තර්ක කිරීම සඳහා සන්ථාගාර සාලා යනුවෙන් වාදාරෝපණය කිරීමටත් වාද කිරීමටත් වෙනමම ස්ථානයක් සකසා දුන්හ. ඔවුන්ගේ දෘෂ්ටීන් සමාජගත වී අවසානයේ සමාජ ගැටලු නිර්මාණය වීම වැළැක්වීම රජවරුන් ගේ අභිලාෂය වූ බව මෙයින් පෙනේ.[8]

විතර්කන හැකියාව සැම අයෙකුටම පවතින හැකියාවක් බව බුදුදහම ද පිළිගන්නා වූ කරුණක් වන්නේ ය. එය චින්තනය හා සම්බන්ධ වන ක්‍රියාවලියක එක් අවස්ථාවක් ලෙස සූත්‍ර ධර්මයන්හී පැහැදිලි කොට ඇත.[9] එබැවින් තාර්කිකත්වය සංකීර්ණ ක්‍රියාවලියක එක් අවස්ථාවක් පමණි. එය

සමාජගත ගැටලු නිර්මාණය කරන ආකාරයත් පෞද්ගලික හා මානසික ගැටලු ප්‍රභවයට මූල බීජ සපයන ආකාරයත් නොයෙක් අවස්ථාවන්හී විස්තර කොට දක්වා ඇත. කෙසේ වුවද තර්කණය යන්නට වඩා විශේෂ අර්ථයක් විතර්කණය යන්නෙහි පවතී. තාර්කිකත්වය හුදු සිය මතය සමර්ථනය කිරීම් වස් භාෂාව මාධ්‍යය කොටගෙන ඉදිරිපත් කරන ප්‍රකාශනයන්ට පමණක් සීමා වේ. එහිදී වඩාත් වැදගත් වන්නේ සිය මතය තුළ ඉදිරිපත් කෙරෙන ප්‍රකාශන කෙතෙක් දුරට පරස්පර විරෝධී නො වන්නේ ද යන්න යි. විතර්කණය තුළ සිදුවන්නේ පුද්ගලයා සිය චින්තනය අවියක් කොටගෙන සංජානිත දේ පිළිබඳව සංවාදී සහ විසංවාදී පැතිකඩ සෑම අතින්ම පරීක්ෂා කරමින් සිදුවන්නා වූ සංකීර්ණ ක්‍රියාවලිය කි. එය අවසාන වශයෙන් ප්‍රපංච ගොඩනගා පුද්ගලයා ත්‍රෛකාලිකව ප්‍රපංචමය ක්‍රියාවලියකට යොමු කරන ආකාරයත් එය දුකෙහි ප්‍රභවයට මුල්වන ආකාරයත් මැනවින් විග්‍රහ කොට තිබේ.[10]

## 4. තර්කණයෙහි ඇති දුර්වලතා

මෙම විතර්කණය වූ කලී නිවැරදි තත්ත්වය ප්‍රකාශ කිරීමට වඩා වැරදි දේ පිළිබඳ සදාතනිකව පවත්නා වූ දෘෂ්ටීන් ජනිත කිරීමට හේතු වේ. තාර්කිකත්වයත් විතර්කණයත් නිසා ප්‍රභවයට පත්වූ මතවාද හැටදෙකක් එකල තිබූ බව බ්‍රහ්මජාල සූත්‍රයෙන් පැහැදිලි වේ.[11] සැබැවින්ම එකල පැවතියේ දෘෂ්ටි කලහය කි. බුදුන් වහන්සේ ද එම කලහයෙහි කොටස්කරුවෙකු කරගැනීමට ඇතැම් වාදාරෝපණය කළ තාර්කිකයන් ගේ උත්සාහය විය. එසේ වුවද උන්වහන්සේ ලෝකයා සමඟ වාදකිරීමට හෝ මතවාද ගැටුමකට යොමු නො වුණ බව සඳහන් වේ.[12] ඒ වෙනුවට සඳහන් වන්නේ වාදයන් දුරුකිරීම කි.[13] බෞද්ධ විමුක්ති මාර්ගයෙහි ඉදිරියට ගමන් කරන විට ක්‍රමයෙන් විතර්කණය ද දුරුකරන බව සඳහන් වීම මෙහිදී සිහිපත් කිරීම ප්‍රස්තුතයට උචිත ය.[14] මෙයම තර්කය පිළිබඳ බෞද්ධ විචාරය පිළිබඳ වැදගත් අවස්ථාව කි. තර්කය හරහා ලබාගන්නා ඥානය යථාර්ථවත් නො වන අතරම එය සැබෑ ආගමික අනුභූතිය ද නො වන බව මෙහි ගම්‍යය යි. තර්කය ආශ්‍රයෙන් ලබාගන්නා අනුභූතීන් වුවද බෞද්ධ සන්දර්භය තුළ ඇගයෙන්නේ නැත. ඒවා ක්‍රමයෙන් නැතිකළ යුතු අනුභූතීන් වශයෙන් විග්‍රහ කොට ඇති නිසා ය.[15]

තර්කය සප්‍රමාණ ඥාන මාර්ගයක් වශයෙන් බුදුදහම මූලික වශයෙන්ම පිළි නො ගන්නේ ඒ පිළිබඳව ගෙනෙන තත්ත්වානුකූල වූ විවරණයක් හරහා ය. බෞද්ධ විග්‍රහයට අනුව තර්කග්‍රාහීන් හෙවත් තර්කය අවිය කරගත් දාර්ශනිකයෝ වර්ග සතරකට අයත් වෙති. පළමු කොටස අනුශ්‍රවය හෙවත් පරම්පරාවෙන් අසා දැනගත් දෙය නිවැරදියැයි පවසමින් තර්ක කරන පිරිස යි. දෙවැනි පිරිස පෙරජාතීන් සිහිපත් කිරීමේ නුවණ උපදවාගෙන ඒ මත පදනම්ව තර්ක කරන පිරිස යි. තෙවැනි පිරිස විවිධ ධ්‍යාන උපදවා ගත්තාහු ඒ මත සිට තර්ක කරති. තවත් පිරිසක් ව්‍යවහාරික ලෝකයේ කරුණු, හේතු සාධක පදනම් කරගෙන තර්ක කරති. නියම තාර්කිකයෝ ලෙස මෙම සිව්වන පිරිස සැලකෙන අතර ඔව්හූ ශුද්ධ වූ තාර්කිකයෝ වෙති.[16] ශුද්ධ තාර්කිකයන් තර්කය හරහා ලබාගන්නා වූ නිගමනයෙහි භව්‍යතා හතරක් පවතින බව සන්දක සූත්‍රයේදී බුදුන් වහන්සේ පෙන්වා දෙති.[17]

1. හරියට තර්ක කොට හරි නිගමනයට පැමිණීම

2. වැරදියට තර්ක කොට වැරදි නිගමනයකට පැමිණීම

3. තාර්කික ඥානය සත්‍ය වන්නට ද පුළුවන

4. තාර්කික ඥානය අසත්‍ය වන්නට ද පුළුවන[18]

මෙම තාර්කික භව්‍යතාවයන්ගෙන් නිවැරදි භව්‍යතාවය වන්නේ කුමක්දැයි සත්‍යෝක්ෂණය කිරීමේ හැකියාවක් නොමැති නිසා තර්කය සප්‍රමාණ ඥාන මාර්ගයක් ලෙස බෞද්ධ සන්දර්භය තුළ ඇගයෙන්නේ නැත.[19]

## 5. තර්කණයෙහි උපයෝගීතාවය

කෙසේවුවද තර්කණයෙහි කිසියම් උපයෝගීතාවයක් ඇති බව යම් යම් අවස්ථාවලදී බුදුන් වහන්සේ පැහැදලි කොට ඇත. තර්කණයෙහි නිවැරදිව යෙදී නිවැරදි වූ නිගමනය ලබාගත හැකි නම් එය ඥාන මාර්ගයක් ලෙස අගය කළ හැකිය. එමනිසා තර්කයෙහි ඇති සීමිත ප්‍රයෝජන පිළිබඳව දේශනා කළ බුදුන් වහන්සේ තර්කයෙන් හැකි තරම් දුර යන ලෙස දේශනා කොට ඇත.[20] එකල පැවැති දාර්ශනික හා ආගමික මතවාදයන් වූ කර්ම නියතිවාදය,[21] ඊශ්වර නිර්මාණවාදය,[22] වර්ණ භේදවාදය[23] වැනි සංකල්පනාවන්ගේ කිසිදු තාර්කික පදනමක් නොමැති බව පෙන්වාදීමට බොහෝ අවස්ථාවලදී තර්කානුකූලව කරුණු දක්වා ඇත. එහිදී තමන් දේශනා කරන කරුණු අතර අන්‍යෝන්‍ය වශයෙන් පැවතිය යුතු ගැළපීම හෙවත් අවිසංවාදීත්වය කෙරෙහි විශේෂ අවධානය යොමු කොට ඇති බව පෙන්වා දිය හැකිය. සමස්ත සූත්‍ර පිටකයම සලකා බැලුවහොත් අපට පෙනෙන්නේ ධර්මමය කරුණු දැක්වීමේදී පරස්පර විරෝධී තත්ත්වයන් මතු නොවන සේ කරුණු දැක්වීමට විශේෂ වූ අවධානයක් යොමුකොට ඇති බව යි. බෞද්ධ සන්දර්භය තුළ වුවද ඇතැම් තාර්කික නීති රීතීන් ක්‍රියාත්මක වන බව මෙයින් පැහැදිලි වන්නේ ය.[24] එමෙන්ම තමන් වහන්සේ සමග විවිධ දාර්ශනික හා පාරභෞතික ප්‍රස්තුත අරබයා වාදවිවාද කිරීමට පැමිණි සච්චක වැන්නවුන්ගේ කරුණු දැක්වීමෙහි පවත්නා දුර්වලතාවයන් පෙන්වා දී එම විසංවාදීත්වය මත එම මතයන්ගේ ඇති නිෂ්ප්‍රමාණ බව පෙන්වා දුන් අවස්ථා අපට හමුවේ.[25] එබැවින් තර්කය ඥාන මාර්ගයක් වශයෙන් සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප වූ බවක් කිව නොහැක. තර්කණයෙහි වුවද උපයෝගීතාමය බවක් දක්නට ඇතත් එය එහි සීමාවන් පිළිබඳ අවබෝධයක් ඇතිව භාවිත කළයුතු බව බෞද්ධ මතය යි.

**පාදක සටහන්**

1. වැඩි විස්තර සඳහා K.N. Jayatilleke, Early Buddhist Theory of Knowledge, Page 170
2. චන්දිම විජේබණ්ඩාර සහ එච්.එම්. මොරටුවගම, ආදී බෞද්ධ චින්තනය, 11 පිටුව
3. -එම- 16-19 පිටු
4. දේවාලේගම මේධානන්ද හිමි, බුදු සමය හා දාර්ශනික ගැටලු, 11-12 පිටු
5. වැඩි විස්තර සඳහා වාච්චේ ධම්මරක්ඛිත හිමි, භාරතීය තර්කවාද පිළිබඳ විමසුමක් (සුමන ප්‍රභා ශාස්ත්‍රීය සංග්‍රහය) 220-221 පිටු
6. සුත්ත නිපාතයේ කලහ විවාද සූත්‍රය හා අට්ඨක පාරායන වග්ග සමකාලීන භාරතයේ පැවති දෘෂ්ටි කලහයේ ස්වභාවය හෙළි කරයි.
7. ක්‍රිස්තු පූර්ව සවන සියවස වන විට භාරතයේ පැවති බුද්ධිවාදී සට්ටනය පිළිබඳව විවරණයක් සඳහා දේවාලේගම මේධානන්ද හිමි, මුල් බුදු සමය;සාමයික පසුබිම, දෙවැනි පරිච්ඡේදය
8. බුද්ධ කාලය වන විට විවිධ හේතූන් පාදක කොටගෙන සමාජයේ සිටි විවිධ සමාජ කණ්ඩායම් අතර පැවති සමාජ ගැටුම් සමාජ ප්‍රශ්න බවට පරිවර්තනය වූ අයුරු සඳහා බලන්න. ධර්මසේන හෙට්ටිආරච්චි, බෞද්ධ සමාජ විද්‍යා ප්‍රවේශය, 14 පරිච්ඡේදය
9. මජ්ඣිම නිකාය, මධුපිණ්ඩික සූත්‍රය"යං සඤ්ජානාති තං විතක්කේති''
10. ප්‍රපංචකරණ ක්‍රියාවලිය ස්වාභාවික සංසිද්ධීන්ගෙන් ආරම්භ වී අවසානයේ එහි කර්මය බවට පත්වන මිනිසා අසරණ වන ආකාරය පිළිබඳ විවරණයක් සඳහා බලන්න.Bhikkhu Nanananda, Concept and Reality කෘතිය
11. Chandima Wijebandara, Early Buddhism: Its Religious and Intellectual Milieu, Chapter 3
12. "නාහං භික්ඛවේ ලොකෙන විවදාමි ලොකො ච භික්ඛවේ මයා විවදති'' සංයුක්ත නිකාය පුප්ඵ සූත්‍රය
13. "නිත්ථරණත්ථාය නො ගහණත්ථාය'' මජ්ඣිම නිකාය, අලගද්දූපම සූත්‍රය
14. දීඝ නිකාය,සාමඤ්ඤඵල සූත්‍රය
15. බෞද්ධ අනුපූර්ව ප්‍රතිපදාව තුළ ඉහළට ගමන් කරන විට විතර්කණය නම් වූ මානසික ක්‍රියාකාරීත්වය අහෝසි වන්නේ දෙවැනි ධ්‍යාන අවස්ථාවට පැමිණීමත් සමගමය. බලන්න, චන්දිම විජේබණ්ඩාර සහ එච්.එම්. මොරටුවගම, බෞද්ධ දර්ශනය හා සංස්කෘතිය, 142 පිටුව
16. මොවිහු පිළිවෙළින් අනුස්සවික තක්කිකා, ජාතිස්සර තක්කිකා, ඣායී තක්කිකා හා සුද්ධ තක්කිකා ලෙස හැඳින්වෙති. මජ්ඣිම නිකාය, චංකී සූත්‍රයට අටුවාව සපයන විට මෙසේ තාර්කිකයන් වර්ග හතරක් පිළිබඳව සඳහන් කෙරේ.
17. "තක්කිස්ස ඛො පන සන්දක විමංසිකස්ස සුතක්කිතම්පි හොති දුතක්කිතම්පි හොති තථාපි හොති අඤ්ඤථාපි හොති''මජ්ඣිම නිකාය, සන්දක සූත්‍රය
18. මෙම භව්‍යතා හතර තරමක් වෙනස් ආකාරයකින් වෙනත් තැනක මෙසේ දක්වා ඇත. හරි දැනුමක් දෙන තර්කයක් විය හැකිය. වැරදි දැනුමක් දෙන තර්කයක් විය හැකිය. එසේ ද විය හැකිය. අන් අයුරකින් ද විය හැකිය.
19. කොස්වත්තේ අරියවිමල හිමි, භාෂාව, තර්කණය හා ඥාන ගවේෂණය පිළිපබඳ බෞද්ධ විචාරය, (විවරණ), 154 පිටුව
20. දේවාලේගම මේධානන්ද හිමි, බුදු සමය හා දාර්ශනික ගැටලු, 17 පිටුව

21. මජ්ඣිම නිකාය, දේවදහ සූත්‍රයේදී ජෛනයන්ගේ කර්ම නියතිවාදයේ ඇති අතාර්කිකත්වය පෙන්වා දී ඇත. බලන්න, චන්දිම විජේබණ්ඩාර සහ එච්.එම්. මොරටුවගම, ආදී බෞද්ධ චින්තනය, 96 පිටුව

22. අල්පිටියේ ඤාණිස්සර හිමි, භාරත දර්ශන, 56 පිටුව

23. Encyclopedia of Buddhism, Extract-No.03.25-35 pages

24. අල්පිටියේ ඤාණිස්සර හිමි, භාරත දර්ශන, 56 පිටුව

25. "න ඛො තේ සන්ධීයති පුරිමෙන වා පච්චමං පච්ඡිමෙන වා පුරිමං ''මජ්ඣිම නිකාය, සච්චක සූත්‍රය